**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 15 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු. 14,742,698 ක මුදල 2014 ඔක්තෝබර් 30 දින ප්‍රතිව්‍යුහගත කිරීම නිසා රු. 16,778,362 දක්වා වැඩිවී තිබූ අතර එසේ වැඩිවූ රු. 2,035,664 ක මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වසරේ පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් එම වසරේ ණයගැති ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී සමාලෝචිත වසරේ ඒ වෙනුවෙන් ලද රු. 1,297,073 ක මුදල විවිධ ණයගැතියන්ට බැරකර තිබීම නිසා විවිධ ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.ඉන් එක් කර්මාන්තයක් වෙනුවෙන් රු. 1,039,368 ක් ගෙවිය යුතුව තිබුණද ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණේ රු. 800,000 ක් ලෙස රු. 239,368 ක් අඩුවෙනි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉටුකර තිබූ රු. 770,567ක් වූ කරගහවල ක්‍රීඩාංගනය ඉදිකිරීමේ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම්

ඉකුත් වර්ෂවල සිට පැවත එන රු. 10,241 ක් වූ හර ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 1,533,118 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 1,077,966 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 255 | 205 | 1 |
| ii. | බදු කුලී | 12,514 | 9,252 | 284 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,054 | 624 | 133 |
| iv. | වෙනත් ආදායම් | 4,312 | 13,562 | 1,624 |

**2.2.2 බලපත්‍ර ගාස්තු**

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 133,065 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාරව මෙම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,570,353 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රේෂණය නොකිරීම සහ අවලංගු කිරීමෙන් පසුව රැස්කිරීම**

2009 වර්ෂයේ සිට 2014 ජූලි 4 දින දක්වා ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් සභාව විසින් රැස්කර තිබූ රු. 598,468 ක මුදල 2015 මාර්තු 08 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**---------------------------**

**(අ) බහු කාර්යය ජංගම කුටි**
**--------------------------**

2013 අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක වූ පළාත්වල දිළිදුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභාව වෙත රු. 270,000 ක් වටිනා කැනපි ආවරණ කුටි 10 ක් ලැබී තිබුණි.

(i) මින් 07 ක් සභාපති, උපසභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 07 දෙනෙක් අතරේ බෙදාගෙන තිබුණි.

(ii) ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කර නොතිබූ මෙම කැනපි ආවරණ කුටි 07 ධූර කාලය නිමාවී පළාත් පාලන ආයතනය විසිරවීමෙන් පසුවද සභාව වෙත නැවත භාරදී නොතිබුණි.

(iii) කැනපි ආවරණ 03 ක් 2015 අප්‍රේල් 07 දින විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේදි භෞතිකව ඉදිරිපත් නොකෙරින.
එම කැනපි ආවරණ කුටි 03 විනාශ වීමෙන් පසු ඒවායේ ඉතිරි බට සණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන යටතේ ලෝහ මිලට ගන්නා පාර්ශවයක් වෙත විකිණීමට කටයුතු යොදා ඇති බව සභාපතිවරයා 2015 ජුනි 15 දින මා වෙත වාර්තා කර තිබුණි.

**(ආ) නොපියවූ අත්තිකාරම්**
**-----------------------**

ඉකුත් වර්ෂයන්ට අදාල රු. 965,636 ක අත්තිකාරම් මුදල් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

-----------------------

(අ) සභාපතිවරයා ඇතුළු සභිකයින් හත්දෙනෙකු තායිලන්තයේ පැවැත් වූ අධ්‍යයන චාරිකාවක් සඳහා සහභාගීවී දින 4 ක් සඳහා අනියම් හා සංයුක්ත දීමනා ලෙස රු. 657,738 ක මුදලක් ලබා ගෙන තිබුණ ද විදේශ ගමන් බලපත්‍ර අනුව දින 03 ක් සඳහා පමණක් අනියම් දීමනාව ලබා ගත හැකි වූයෙන් එකතුව රු. 27,342 ක මුදලක් වැඩිපුර ගෙවා ඇතිබව නිරීක්ෂණය විය.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය සංශෝධනය කරමින් නිකුත්කළ 2014 ජූලි 04 දිනැති අතිරේක අංක 28 අනුව රු. 500,000 ට වැඩි මිළදී ගැනීම් සඳහා අවම වශයෙන් මිළ ගණන් 5ක් වත් ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,051,700 ක් වූ සභා බල ප්‍රදේශයේ අතුරු මාර්ග අලුත්වැඩියා කටයුතු සඳහා යන්ත්‍ර සඳහා ගෙවීම් වෙනුවෙන් ලබා ගෙන තිබුණේ මිළ ගණන් 03 ක් පමණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාර්ග කර්මාන්ත 03 ක් වෙනුවෙන් එම මාර්ග වල පාදම සඳහා සහ ගල්කැට මතු පිට ගල් කුඩු ඇතිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා ගල් කුඩු මිලදී ගෙන තිබීම නිසා එකතුව රු. 51,843 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මහාමාර්ග හා වරාය අමාත්‍යාංශ අතිරේක ලේකම් ගේ 2014 ජූලි 02 දිනැති අංක MPH/HYW/MNG/05/Cer/ 14-1 දරන ලිපිය අනුව මග නැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී අමුද්‍රව්‍ය මත එකතු කරනු ලබන සියයට 10 අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද 2014 ජූලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 04 ක් සඳහා එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 23,644 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය